



# නිවේදනයයි

## 2016 අංක 12 දරණ

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත

ඉහත පනත යටතේ මෙම ආයතනයට අදාල තොරතුරු ලබා ගැනීම සදහා පහත සදහන් තොරතුරු නිලධාරීන් වෙත RT1 01 දරණ අයදුම් පත්‍රය මගින් අයදුම් කල හැකියි.

### තොරතුරු නිලධාරීන්

ශෂිකා දේවප්‍රිය මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂක පාලන
දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
පහළ ඩික්සන් පාර, ගාල්ල .
දුරකථන අංකය - 091-2223840
විද්‍යුත් ලිපිනය - shashidewa@gmail.com

සී.එස් .එගොඩගේ මිය - ප්‍රධාන ගණකාධිකාරී
දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
පහළ ඩික්සන් පාර, ගාල්ල .
දුරකථන අංකය - 091-2224609
විද්‍යුත් ලිපිනය - chamini.egodage@gmail.com

**වෛද්‍ය බී.සී.මල්ලවආරච්චි මිය - ප්‍රජා වෛද්‍ය විශේෂඥ**
**දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**
**පහළ ඩික්සන් පාර, ගාල්ල .**
**දුරකථන අංකය - 091-2225691**
**විද්‍යුත් ලිපිනය - planningpdhs@gmail.com**

**එච්.ජී.ජී. වීරසේකර මිය - පරිපාලන නිලධාරී**
**දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**
**පහළ ඩික්සන් පාර, ගාල්ල .**
**දුරකථන අංකය - 091-2223839**
**විද්‍යුත් ලිපිනය - gweerasekara@gmail.com**

1. තොරතුරු ලබා ගැනීමට ලිඛිත අයදුම්පත්‍රය හෝ ලිපියක් හෝ වාචික ඉල්ලීමක් තොරතුරු නිළදාරියා වෙත ඉදිරිපත් කර එය ලැබුණු බවට ලිපියක් ලබා ගන්න.

2. ඔබේ ඉල්ලීමට අදාල තොරතුරු සැපයිය හැකිද යන්න පිළිබදව හැකි ඉක්මනින් කෙසේ වුවද දින 14 ක් තුළ දන්වනු ලැබේ.

3. ඉල්ලා සිටින ලද තොරතුරු ඔබට දීමට තීරණය කළහොත් කොමිෂන් සභාව නියම කළ ගාස්තුවක් ගෙවිය යුතු නම් ඒ අනුව ගොස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතු නොවේ නම් ගොස්තු රහිතව ඔබට දින 14 ක් තුළ තොරතුරු ලබා දෙනු ලැබේ.

4. ගාස්තු ගෙවීමෙන් පසු දින 14 ක් තුළ තොරතුරු ලබා දීම අපහසුවේනම් තොරතුරු නිළදාරියා විසින් එකී කාලය දිගු කිරීමට අවශ්‍ය හේතු සදහන් කරමින් දින 21 ට නොවැඩි අතිරේක කාලයක් තුළ ඔබ ඉල්ලා සිටි තොරතුරු ලබා දෙනු ලැබේ.

5. තොරතුරු ලබා ගැනීම සදහා වන ඉල්ලීම යම් පුරවැසියෙකුගේ ජීවිතය හා පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක ඉල්ලීම සදහා ප්‍රතිචාර දැක්වීම ඉල්ලීම ලැබී පැය 48 ක් ඇතුලත සිදු කරයි.

6. තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමකට අදාළව

තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම.

පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම.

පනත මගින් නිශ්චිතවම දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම.

සම්පූර්ණ නොවූ සාවද්‍ය තොරතුරු ප්‍රකාශ කිරීම.

එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශ වීම වැලැක්වීම සඳහා තොරතුරු විකෘති කර විනාශ කර හෝ අස්ථාන ගත කර ඇති බවට තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම.

අතෘප්තියට පත් වන්නේ නම් පහත සඳහන් නිළදාරියා වෙත දින 14 ක් තුළ අභියාචනා ඉදිරිපත් කරන්න.

## නම් කළ නිළධාරියා

**විශේෂඥ වෛද්‍ය චන්දිම සිරිතුංග මහතා - පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ**
**දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**
**පහළ ඩික්සන් පාර, ගාල්ල .**
**දුරකථන අංකය - 091-2234980**
**විද්‍යුත් ලිපිනය - csiritunga@yahoo.com**

7. මෙම නිවේදනයේ 6 වන වගන්තිය පරිදි අභියාචනාවක් ඉදිරිපත් කිරීමේදී RTI 10 දරන අයදුම්පත පුරවා ඉදිරිපත් කරන්න RTI 10 දරන අයදුම්පත පිරවීම අනිවාර්ය නොවේ. තොරතුරු ඉල්ලා සිටින්නාට RTI 10 අයදුම් පත්‍රයේ සඳහන් අභියාචනය විභාග කිරීමට අවශ්‍ය මූලික තොරතුරු සඳහන් කරමින් ලිපියක් මගින් අභියාචනය ඉදිරිපත් කළ හැක .